
# දඟකාර දුඹුරා






ඩබ්ලිව්. ඒ. තෙනුලි උදමයා මෙතුසරි වීරසිංහ

# දඟකාර දුඹුරා

කතෘ - ඩබ්ලිව්. ඒ. තෙනුලි උදමයා මෙතුසරි  වීරසිංහ

සියලුම හිමිකම් කතෘ සතුය



# පිදුම...

## මාගෙ ආදරනීය අම්මාට,
## අප්පච්චිට සහ සුරතල්
## මල්ලිට



# පෙරවදන

වත්මන් අධ්‍යාපනය ඵලදායි පුරවැසියෙක්යෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුම කරගත් මහා මයා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණය යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍යය කෙතෙ ලෙඛක අංකුර දහස් ගණනක් වැපිරිමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි වූ ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම් සලකා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" වියාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යයන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂීකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

මේ කතාව හරිම දඟකාර මකුළු පැටියෙක් ගැනයි. එයාගේ නම දුඹුරා. දුඹුරාගේ ඇඟ දුඹුරු පාටයි, එයාට කකුල් අටයි,ඇස් දෙකකුයි, තියෙනවා. හැබැයි කන් දෙකක් නැහැ.මෙයාට මේ නම දැම්මේ දුඹුරා හිටපු චෙරි ගසේ අනෙක් සත්තු යාළුවෝ යි. දුඹුරා ජීවත් වුණේ මේ චෙරි ගසෙයි. චෙරි ගස හරිම ලස්සනයි. හැම දාම මල් ගෙඩි වලින් පිරිලා.



එත් මේ  දුඹුරා නම් හරිම නපුරුයි,කම්මැලියි . එයා පුංචි කාලේම එයාගේ අම්මයි තාත්තායි එයාව දාලා ගිහිල්ලා. එයා කැමති මුළු දවසම එයාගේ මකුළු දැලට වෙලා නිදාගෙන ඉන්න. කුරුල්ලෝ, සමනලයෝ, කුඹියෝ, දිඹියෝ, දළඹුවෝ එක්ක සෙල්ලම් කරන්න යනනෙත් නැහැ. අනිත්  යාළුවෝ දුව පනිනමින් , සිංදු කියමින්, නටමින් දගලන විට දුඹුරා තනියම මකුළු දැලට වී බුම්මා ගෙන බලා ගෙන ඉන්නවා. ඊට පස්සේ එයා ළගට එන කවුරු හරි ඉක්මනින් ම  අල්ල ගන්නවා.






ඉතිං මේක දන්න පුංචි යාළුවෝ දුඹුරාගෙන් බේරිලා ඉන්න හොඳට දන්නවා . සමහර වේලාවට මේ යාළුවෝ මකුළු දැල සොළවලා නැත්තම් මකුළු දැලට කොළ දමලා නිදා ගෙන සිටින දුඹුරාව ඇහැරවනවා. ඉතිං එතකොට දුඹුරාට හොඳටම තරහ යනවා. එයාගේ දැලට බැරි වෙලාවත් කවුරු හරි හසු වුණොත් දුඹුරා එයාගේ කෙළවලින් ඒ සතාව ඔතලා ඔතලා යුෂ ටික විතරක් උරා බොනවා. කන්නෙ නැහැ.

ඉතිං ඔන්න එක දවසක් පළගැටියෙක් වෙරි ගසට ආවා. එයාට හරිම සතුටු හිතිලා ඒ අත්තේන් මේ අත්තට මේ අත්තෙන් ඒ අත්තට සතුටින් කෑ ගසමින් පැන පැන සිටියා. එක් වරම පළගැටියා දුඹුරාගේ මකුළු දැලේ පැටලුණා. ඉක්මනින් අවදි වුණු දුඹුරා පළගැටියාව අල්ල ගත්තා.දුඹුරාගේ කෙළවලින් පළගැටියාව ඔතන්න පටන් ගත්තා.

මේ අතරේ පළගැටියා කෑ ගහනවා

“ අනේ ! මාව බේර ගන්න. අනේ මාව බේරගන්න” කියලා.




මේක  ඇසුණු  වෙරි ගසේ සිටි හැම යාළුවෙක්  ම කලබල වුණා.  පැණි කුරුල්ලා ඉක්මනින් ම  එයාගේ හොටින්  පළගැටියාව  දුඹුරාගෙන්  බේරා  ගත්තා.  අනෙක් දළඹුවෝ, දිඹියෝ දුඹුරාගේ මකුළු දැල  කඩලා දැම්මා.





දැන් දූඹුරා බිමට වැටෙන්න  ඔන්න මෙන්න

“අනේ ! මාව බේර ගන්න” කියලා දූඹුරා කෑගැහුවා.




කවුරුත් උදවු කලේ නෑ. මේ සියල්ල බලා සිටි චෙරි ගසට දුක හිතිලා දූඹුරාව අත්තක් උඩට ගත්තා. බිමට වැටෙන්න දුන්නනැහැ .  දූඹුරට ලැජ්ජත් හිතුණා. ඒත් එයා චෙරි ගසට ස්තුති  කළා.

“හැමෝම එකිනෙකාට උදවු කර ගනිමින් සහයෝගයෙන් ජීවත් විය යුතුයි” එවිට මේ ලෝකය තවත් ලස්සන වන බව චෙරි ගස හැමෝටම කියලා දුන්නා.

ඉතිං එදා ඉඳලා දුඹුරා චෙරි ගසේ අනෙක් සියළු මිතුරන් සමග සතුටින් සහයෝගයෙන් ජීවත් වුණා. ඉතිං චෙරි ගස තව තවත් ලස්සන වුණා. හැමෝම සතුටින් එක පවුලක් වගේ ජීවත් වුණා.







# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිතය නිර්මාණ හැකියාටන් ඔනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාතන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම වව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් පූජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන්න විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පහමු.

මෙයට සෙනෙවිරත්න මහලේකම්පාසල් දරුවන් ග්‍රන්ථකරණය යොමුකළ
ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.01**